0184

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
Islamic Civilization I

47 S I

2019.08.05 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** ඉස්ලාම් ශිෂ්ටාචාරයේ පදනම නිරූපණය වන කාණ්ඩය තෝරන්න.
(1) ඉබාදත්, ඉමාරත්, කිලාෆත් (2) තව්හීද්, රිසාලත්, මආද්
(3) ඉස්මත්, ඉමාමත්, විලායත් (4) වරාසත්, වක්ෆු, සදකා
(5) විලායත්, තස්කියත්, හකීකත්

**2.** කලීෆා උමර් බින් අබ්දුල් අසීස් (රහ්) විසින් හදීස් ක්ෂේත්‍රයේ යෙදවූ පුද්ගලයා වන්නේ,
(1) ඉමාම් කුතෛබා බින් සඅත් ය. (2) ඉමාම් සුලෛමාන් බින් හර්ෆ් ය.
(3) ඉමාම් ෂිහාබුදීන් සුහ්රි ය. (4) ඉමාම් ඊසා බින් නස්ර් ය.
(5) ඉමාම් ඉස්හාක් බින් රාගවෛහි ය.

**3.** **කියාස්හි** මූලිකාංගවල **ෆර්උ** යන්නෙහි අර්ථය කුමක් ද?
(1) විනිශ්චය (2) පොදු සාධක (3) සැසඳීම
(4) ඒකමතික තීරණය (5) අලුත් දෙයක්

**4.** ශ්‍රී ලංකාවේ සංදේශ සාහිත්‍යයන්හි භාවිත කර ඇති යොන්ලිය යන පදයෙන් හඳුන්වන්නේ,
(1) ශ්‍රී ලංකාවේ පැරණි වැසියන් ය. (2) හින්දු ස්ත්‍රීන් ය.
(3) බෞද්ධ ස්ත්‍රීන් ය. (4) මුස්ලිම් ස්ත්‍රීන් ය.
(5) ඉන්දීය රජ පරපුරේ අය ය.

**5.** තාරකා විද්‍යා ක්ෂේත්‍රයේ 'සිජ්' සහ 'අල්මුස්ත උමල්' යන පදවලින් නිරූපණය වන්නේ,
(1) තාරකා විද්‍යාවට අයත් උපකරණ ය. (2) තාරකා විද්‍යා වගු ය.
(3) තාරකා විද්‍යා මධ්‍යස්ථාන ය. (4) තාරකා විද්‍යා පර්යේෂණාගාර ය.
(5) තාරකා ය.

**6.** පහත වගුවේ **X** තීරුවෙන් කතෘවරුන් ද **Y** තීරුවෙන් ඔවුන් විසින් ලියූ ග්‍රන්ථවල නම් ද අනුපිළිවෙළින් තොරව දක්වා ඇත.

| X | Y |
|---|---|
| 1. ඉමාම් අබුලයිස් සමර්කන්දි | A - අල් ෆහ්රුල් මුහීද් |
| 2. ඉමාම් ෂාෆිඊ | B - අල් උම්මු |
| 3. ඉමාම් ෆක්රුදීන් අර්රාසි | C - මෆාතිකුල් කයිබ් |
| 4. ඉමාම් ආලූසි | D - රූහුල් මආනි |
| 5. ඉමාම් අබූ හයියාන් | E - බහ්රුල් උලූම් |

ඉහත **X** තීරුවේ සඳහන් කතෘවරුන්ගේ අනුපිළිවෙළට අනුව **Y** තීරුවේ සඳහන් ග්‍රන්ථවල නම් පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.
(1) B C D E A (2) B E C D A (3) E B C A D (4) E B C D A (5) E C B D A

[දෙවැනි පිටුව බලන්න.

**7.** ආගමික සංහිඳියාව ආරක්ෂා කිරීම සඳහා නබි තුමා සහ අනෙක් ප්‍රජාවන් අතර ඇති වූ සිද්ධියක් වන්නේ,
(1) හුදෛබියා සම්මුතියයි. (2) හිල්පුල් ෆුලුල් සිද්ධියයි.
(3) අකබා සම්මුතියයි. (4) නජ්රාන් වාසීන් සමග ඇති කරගත් එකගතාවයයි.
(5) කෘබාහි 'හජ්රුල් අස්වද්' තැන්පත් කිරීමයි.

**8.** **මුඉස්සුත් තෞලා** යන අන්වර්ථ නමින් හැඳින් වූ පාලකයින් නියෝජනය කළ කුඩා රාජ්‍යය වන්නේ,
(1) ෆුවයිද්වරුන් ය. (2) සෆව්වරුන් ය. (3) සෙල්ජුක්වරු ය.
(4) ෆාතිමීන්වරු ය. (5) අයියුබිවරු ය.

**9.** පවුල් පරිපාලනය පිළිබඳව ඉස්ලාම් මග පෙන්වීම කුමක් ද?
(1) පවුලේ නායකත්වය පිරිමින් සතු වන නමුත් ස්ත්‍රීන්ගෙන් අදහස් විමසීමද අත්‍යවශ්‍ය වේ.
(2) පවුලේ නායකත්වයේ ස්ත්‍රීන්ට කිසිදු භූමිකාවක් නැත.
(3) පවුලේ කාරණාවල දී භාර්යාවගේ අදහස් විමසීම ස්වාමිපුරුෂයකුට අත්‍යවශ්‍ය නොවේ.
(4) භාර්යාවගේ අදහස් දැනගත් පසු එයට ප්‍රතිවිරුද්ධව කටයුතු කිරීම යෝග්‍ය වේ.
(5) රැකියාවල යෙදීම පිරිමින් සතු ය. පවුල නඩත්තු කිරීම ස්ත්‍රීන් සතු ය.

**10.** "මහා පාපයක් සිදු කළ කිසිවකුටත් නබිතුමාගේ ෂෆාඅත් ලබා ගත නොහැකි ය." යන අදහස ඉදිරිපත් කළ පාර්ශ්වය,
(1) අල් - අෂ් අරියියා ය. (2) අල් - මුර්ජිආ ය.
(3) අල් - මුඃතසිලා ය. (4) අල් - ජබරියියා ය.
(5) අල් කවාරිජ් ය.

**11.** මහනුවර රාජධානියේ පරිපාලන ව්‍යුහය තුළ මුස්ලිම්වරු සේවය කළ **මඩිගේ බද්ද** යන පදය නියෝජනය කරන දෙපාර්තමේන්තුව කුමක් ද?
(1) මුළුතැන්ගෙය (2) ආරක්ෂක (3) වෛද්‍ය
(4) සතුන් නඩත්තු කිරීම (5) මත්ස්‍ය කර්මාන්තය සහ ප්‍රවාහන

**12.** "ඔබගේ ආගම ඔබට ය මාගේ අගම මට ය" යන අල්-කුර්ආන් වාක්‍යය හඟවන නිවැරදි අර්ථය කුමක් ද?
(1) ඕනෑම අයෙකුට තම ආගම පිළිපැදීමේ පූර්ණ අයිතියක් ඇත.
(2) පවතින තත්ත්වය හා පරිසරයට අනුව ඕනෑම අයෙකුට තමන්ගේ ආගමික විශ්වාස අනුව කටයුතු කළ හැකි ය.
(3) ඉස්ලාමය තවකෙනෙකුට කියා දීම සෑම මුස්ලිම්වරයෙකුගේම යුතුකම වේ.
(4) ඕනෑම අයෙකුට අනෙක් ආගමික විශ්වාසයන්ට මැදිහත් විය හැකි ය.
(5) ආගමික විශ්වාසයන් නිශ්චිත ඒවා නොවේ. නිතර වෙනස්වීම්වලට ලක් වේ.

**13.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.
A - විද්‍යා ක්ෂේත්‍රයේ යුරෝපීයන්ගේ නැගීමට හේතු වූයේ ස්පාඤ්ඤ මුස්ලිම්වරුන් ය.
B - දේශ ගවේෂක වස්කෝ ද ගාමාට ඉන්දියාවට පැමිණීමට මග පෙන්වූයේ ඉබ්නු මජිද් වේ.
C - ස්කැන්ඩ්රියාවේ පිහිටි කාලගුණ පරීක්ෂණ මධ්‍යස්ථානය ලෝකයේ පිහිටුවන ලද පළමුවන කාලගුණ පරීක්ෂණ මධ්‍යස්ථානය වේ.
D - මන්ජනික්, තබාබා වැනි යුද උපකරණ පළමුව හඳුන්වා දුන්නේ මුස්ලිම්වරුන් ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමන ඒවා ද?
(1) A සහ B ය. (2) B සහ C ය. (3) C සහ D ය.
(4) A, B සහ C ය. (5) B, C සහ D ය.

**14.** **මස්ලහා** පදනමින් ගනු ලැබූ තීරණයකට එක් උදාහරණයක් වන්නේ,
(1) උමර් (රලි) සමයේ අශ්වයින් මත පනවන ලද සකාත් බද්ද ය.
(2) බල්ලා දිව ගෑ භාජනයක් හත්වතාවක් සේදිය යුතු ආකාරයට ම ඌරෙකු දිව ගෑ භාජනයක් හත් වතාවක් සේදීම ය.
(3) මත්පැන්වලට පනවා තිබෙන 'හරාම්' යන තීන්දුව මත්ද්‍රව්‍ය සියල්ලට ම අදාළ තීන්දුවක් ලෙස ගැනීම ය.
(4) ස්ත්‍රීන්ට රත්‍රං හලාල්ය යන තීන්දුව ය.
(5) අබූබක්කර් (රලි) තුමා අල්-කුර්ආනය සංග්‍රහ කිරීමට ගත් ක්‍රියාමාර්ග ය.

[ තුන්වැනි පිටුව බලන්න.

**15.** මුස්ලිම් නායකයන් අතුරෙන් ශ්‍රී ලංකාවේ නිදහස ලබා ගැනීමේ ක්‍රියාවලියේ දී රටේ තත්ත්වය පෙරදැරි කොටගෙන තමාගේ මතය ප්‍රකාශ කළ තැනැත්තා වන්නේ,
(1) සර් රාසික් ෆරීද් ය. (2) ඒ. එම්. ඒ. අසීස් ය.
(3) ආචාර්ය බදියුදීන් මහ්මුද් ය. (4) තුවාන් බුර්හානුදීන් ජායා ය.
(5) වෛද්‍ය එම්. සී. එම්. කලීල් ය.

**16.** අල්-කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමට උස්මාන් (රලි) තුමා විසින් පත් කරන ලද කණ්ඩායමේ සාමාජිකයකු වන්නේ,
(1) උබෛ බින් කඃබ් (රලි) ය. (2) අබූ කුසෛමා (රලි) ය.
(3) අබූ දර්දා (රලි) ය. (4) හුදෛබතුල් යමානි (රලි) ය.
(5) සඊද් බින් ආස් (රලි) ය.

**17.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඉස්ලාම් ශිෂ්ටාචාරය පරලොව ජයග්‍රහණ ඉලක්ක කර සැකසී ඇත.
(2) අල්-කුර්ආන්වලට මුස්ලිම්වරයෙකුගේ පළමු යුතුකම වන්නේ එය පාරායනය කිරීම පමණක් ය.
(3) 'ඉස්රායිලියියාත්' යනු තෆ්සීර් සමග ඇතුළත් කළ ප්‍රබන්ධ කථා ලෙස සැළකේ.
(4) මිනිස් ජීවිතයට මගපෙන්වීමට මිනිස් බුද්ධිය පමණක් ප්‍රමාණවත් වේ.
(5) "ජාමිඋල් කුර්ආන්" යන අන්වර්ථ නාමය සයිද්බින් සාබිත් (රලි) ට හිමි වේ.

**18.** පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
A - අරාබිවරු දුරස්ථ කිරීම
B - තුර්කිවරුන්ගේ බලපෑම
C - කුඩා රාජ්‍යයන්ගේ බිහිවීම
D - බෛතුල්මාල් අවභාවිතය
E - අනුප්‍රාප්තිකයන්ගේ විනය නොමැතිකම
F - කර්බලා සිද්ධිය
G - අහ්ලුල් බෛත්වරුන්ට රාජ්‍ය පාලනය හිමිකම
ඉහත කරුණු අතුරෙන් අබ්බාසිවරුන්ගේ බිඳවැටීමට හේතු වූ කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A, C, E (2) A, E, F (3) B, C, F (4) B, D, G (5) E, F, G

**19.** **'ආලමුල් ෆර්සක්'** යන්නෙහි අර්ථය
(1) නැවත නැගිටවීමයි. (2) ගර්භාෂයේ ජීවිතයයි.
(3) පරලොව ජීවිතයයි. (4) සොහොන්ගැබේ ජීවිතයයි.
(5) ස්වර්ගස්ථ ජීවිතයයි.

**20.** පහත වගුවේ **X** තීරුවෙන් ඉස්ලාම් ප්‍රතිසංස්කරණයක් හා සම්බන්ධ පුද්ගලයන් කිහිප දෙනෙකුගේ නම් සහ **Y** තීරුවේ එම පුද්ගලයන් හා ආසන්නව සම්බන්ධ වන සිද්ධීන් දක්වා ඇත. නමුත් ඒවා දැක්වෙන්නේ අනුපිළිවෙළින් නොවේ.

| X | Y |
|---|---|
| 1. මෞදූදි (රහ්) | A - ඉඛ්වානුල් මුස්ලිමීන් |
| 2. ඉල්යාස් (රහ්) | B - දීනේ ඉලාහි ප්‍රතික්ෂේප කිරීම |
| 3. අහමද් සිර්හින්ද් (රහ්) | C - උයෛනා |
| 4. හසනුල් බන්නා (රහ්) | D - තර්ජුමානුල් කුර්ආන් |
| 5. මොහොමඩ් බින් අබ්දුල් වහ්හාබ් (රහ්) | E - කාන්දලා |

ඉහත **X** තීරුවට අනුව **Y** තීරුවේ සඳහන් කරුණු පෙළගැස්වූ පිළිතුර තෝරන්න.
(1) A B C D E (2) B D A C E (3) B D E A C
(4) D B A E C (5) D E B A C

**21.** **අල් - මුහ්කම්** යන්නෙහි අර්ථය වන්නේ,
(1) වෙනස්කම්වලට ඇතුළත් කළ අල්-කුර්ආන් වාක්‍යයන් ය.
(2) විවිධ අර්ථයන් දෙන අල්-කුර්ආන් වාක්‍යයන් ය.
(3) නැවත නැවතත් කියැවෙන අල්-කුර්ආන් වාක්‍යයන් ය.
(4) මක්කී - මදනී සූරාවල් හඳුන්වන අල්-කුර්ආන් වාක්‍යයන් ය.
(5) සමාන අර්ථයන් දෙන නිශ්චිත අල්-කුර්ආන් වාක්‍යයන් ය.

[ හතරවැනි පිටුව බලන්න.

**22.** අදහස් වෙනස් වන කරුණුවල දී "ඉමාම්වරුන් අතුරෙන් සමාන අදහස් දැරූ කාරණා සම්බන්ධයෙන් අපි අන්‍යෝන්‍ය ලෙස සහයෝගය දක්වමු විරුද්ධ මතයන් දැරූ කාරණාවල දී එකඟ විය හැකි හේතු දැක්වීමට උත්සාහ කරමු." යන මතය ප්‍රකාශ කළ පුද්ගලයා,

(1) මුස්තෆා අහමද් ෂර්කා ය. (2) අහමද් අර් රයිසූනි ය.
(3) ඉමාම් රෂීද් රිලා ය. (4) මුස්තෆා බින් කරාමා ය.
(5) මෞලානා අබුල් හසන් අලි නද්වි ය.

**23.** අල්-කුර්ආන්, ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර අන්‍යෝන්‍ය සබඳතාවය කුමන දෙයට උපමා කොට දක්වා ඇත්තේ ද?

(1) ඇඳුම් (2) නිවස (3) ආහාර (4) පතිවත (5) වාහනය

**24.** පහත වගුවේ **X** තීරුවෙන් සහබාවරුන්ගේ නම් සහ **Y** තීරුවෙන් ඔවුන් සම්බන්ධ වූ සිද්ධීන් කිහිපයක් අනුපිළිවෙළින් තොරව දක්වා ඇත.

| X | Y |
|---|---|
| 1. ජඃෆර් බින් අබිතාලිබ් (රලි) | A - අගල් යුද්ධයේ දී උපදෙස් දුන් පුද්ගලයා |
| 2. මුස්අබ් බින් උමෛර් (රලි) | B - මදීනාවට යැවූ ප්‍රචාරකයා |
| 3. මආද් බින් ජබල් (රලි) | C - හුදෛබියා සම්මුතිය මුස්ලිම් පාර්ශවයෙන් ලියූ පුද්ගලයා |
| 4. අලි බින් අබීතාලිබ් (රලි) | D - ඇබිසිනියාව සඳහා හිජ්රත් |
| 5. සල්මාන් ෆාරිසි (රලි) | E - යෙමනයට ආණ්ඩුකාරවරයා ලෙස පත් වූ පුද්ගලයා |

**X** තීරුවට අනුරූපව **Y** තීරුවේ ඇති සිද්ධි අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන වරණය තෝරන්න.

(1) ABCDE (2) ACDEB (3) DBECA (4) DCBAE (5) EABCD

**25.** පහත ප්‍රකාශ සලකන්න.

A - නබිතුමාගේ අවධියේ සිට ම හාසිමීවරු ශ්‍රී ලංකාවේ දක්නට සිටි බව 'ෆුතුහුල් බුල්දාන්' යන ග්‍රන්ථයේ සඳහන් වේ.
B - ඉස්ලාමය ගැන දැනගෙන පැමිණෙන ලෙස නබිතුමා වෙත ශ්‍රී ලංකාවේ අග්‍රබෝධි රජු දූතයෙකු යැවූ බව ඉබ්නු සහ්රයාර් සඳහන් කරයි.
C - පොළොන්නරුව රාජධානියේ මුස්ලිම්වරු හතරදෙනෙක් රජුගේ උපදේශකයන් වශයෙන් සේවය කළ බව සඳහන් වන අදහස මහාචාර්ය එස්. පරණවිතාන පිළිගෙන ඇත.
D - කලීෆා වලීද් තුමාට ශ්‍රී ලංකාවේ රජු විසින් යවන ලද ත්‍යාග ඉන්දියාවේ රජ කෙනෙක් විසින් මංකොල්ල කෑ නිසා සින්දි බලා මුස්ලිම්වරු යුද්ධයට යෑමට හේතු වූ බව අල්- ඉද්රීසි අදහස් දක්වා ඇත.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?

(1) D ය. (2) A සහ B ය. (3) B සහ C ය. (4) C සහ D ය. (5) B, C සහ D ය.

**26.** පහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) නබිවරුන්ගේ ඉතිහාසයේ 'දීන්' සැම විටම එකක්ව පැවති අතර 'ෂරීඅත්' වෙනස් වී ඇත.
(2) ෆාතිමීන්වරු බැග්ඩෑඩය තම අගනුවර ලෙස පිළිගත්හ.
(3) 'මංගා'ගේ 'සිද්ධාන්ත' යන තාරකා විද්‍යා ග්‍රන්ථය අබූ මහ්ෂර් නැමැත්තා අරාබි බසට පරිවර්තනය කළේ ය.
(4) මහා පරාක්‍රමබාහු රජුගේ නියෝජිතයකු ලෙස අබු උස්මාන් ඊජිප්තුවට තානාපති ලෙස යවන ලදී.
(5) හදීස් වර්ග කිරීමේ සම්ප්‍රදාය සහාබාවරුන්ගේ කාලයේ සිට භාවිතයේ පැවතුණි.

**27.** ශ්‍රී ලංකා - අරාබි සබඳතාවය පැරණි වන අතර ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දීමට අරාබි මුස්ලිම් වෙළෙන්දන්ගේ මැදිහත් වීම ප්‍රබල ලෙස පැවතිය ද ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතර ආරාබි මුස්ලිම් සංස්කෘතිය ස්ථාපිත **නොවීමට** හේතු වූ වඩාත් සුදුසු කාරණය වන්නේ,

(1) අරාබිවරු ශ්‍රී ලංකාව තාවකාලික පදිංචි ස්ථානයක් ලෙස පමණක් භාවිත කිරීම ය.
(2) වෙළෙඳාමෙහි යෙදී සිටි අරාබිවරු තමන්ගේ සංස්කෘතික අංගයන් හා සම්ප්‍රදායන් හඳුන්වා දීමට උනන්දු නොවීම ය.
(3) අරාබිවරුන්ගෙන් පසුව ශ්‍රී ලංකාවේ දකුණු ඉන්දීය මුස්ලිම්වරුන්ගේ බලපෑම් ප්‍රබල වූ අතර ඔවුන්ගේ ක්‍රියා ආගමික ක්‍රියා ලෙස පෙරමුණ ගැනීම ය.
(4) යටත්විජිත පාලන සමයේ ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ආගමික, සමාජ ක්ෂේත්‍රයන් සීමාකොට පැවතීම ය.
(5) අරාබි භාෂාවෙන් සැකසුණු ඉස්ලාම් දැනුම කෙරෙහි ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු හුරු නොවීම ය.

**28.** ලෝකය ගෝලාකාරයැයි හඳුනාගෙන එහි වට ප්‍රමාණය ගණනය කිරීමට සමීකරණයක් මුල්වරට හඳුන්වා දුන් මුස්ලිම් විද්වතා,
(1) අල්බිරූනි වේ. (2) අල්හුවාරිස්මි වේ. (3) අල්මුකද්දසි වේ.
(4) මාෂා අල්ලාහ් වේ. (5) අබූ සර්ද් අස්-සන්ජරි වේ.

**29.** අරාබි රටේ යුදෙව් ආගම හඳුන්වාදීමට හේතු වූ කණ්ඩායම
(1) නුලෛර්, කුරෛෂ් සහ සකීබ් ය. (2) නුලෛර්, කුරෛෂ් සහ කුරෛලා ය.
(3) කුරෛෂ්, කෙනුකා සහ සකීබ් ය. (4) කෙනුකා, සකීබ් සහ කුරෛෂ් ය.
(5) කුරෛලා, කෙනුකා සහ නුලෛර් ය.

**30.** පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් සිද්දිලෙබ්බෙ විද්වතානන් විසින් රචිත ග්‍රන්ථය වන්නේ,
(1) ඉරෙයුම් මරෙයුම් ය. (2) අසන්බෙ සරිත්තිරම් ය.
(3) ෂාන්දි මාර්ක්කම් ය. (4) තොලුකෙ අඩවු ය.
(5) ෆත්හුද් දයාන් ය.

**31.** ඉස්ලාම් අධිරාජ්‍යයේ ආරක්ෂාව සඳහා මුලින්ම නාවික හමුදාවක් ස්ථාපිත කළ පුද්ගලයා
(1) කලීෆා මුආවියා (රලි) ය. (2) කලීෆා හාරූන් අල්-රෂීද් ය. (3) කලීෆා මඃමූන් ය.
(4) කලීෆා උස්මාන් (රලි) ය. (5) කලීෆා වලීද් බින් අබ්දුල් මලික් ය.

**32.** **සින්දීක්වරු** කවරහුද?
(1) හදීස් දැනුම් දෙන්නන් (2) ඉස්ලාම් විරුද්ධවාදීන් (3) හනීෆ්වරු
(4) බයිසන්තියර්වරු (5) අදේවවාදීන්

**33.** පහත සඳහන් වන්නේ මුස්ලිම් ප්‍රජාව තුළ භාවිතයේ පැවති වචන කිහිපයකි.

A - තස්කියා E - ෂෙයිකු
B - මුරීද් F - හළරා
C - ඉල්ලත් G - ඉස්මත්
D - මුකල්ලිද් H - අවුරාත්

ඉහත වචන අතුරෙන් **තසව්වුෆ්** හා සම්බන්ධ වූ වචන සහිත පිළිතුර තෝරන්න.
(1) A, B, E, F, H (2) A, C, E, G, H (3) A, D, E, F, H
(4) B, C, D, E, F (5) C, E, F, G, H

**34.** පහත සඳහන් වනුයේ ශිෂ්ටාචාරයන් හා සම්බන්ධ වූ ප්‍රකාශ කිහිපයකි.
A - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය, ඉරාකයේ බැබිලෝනියාව අගනුවර කොට ගෙන තිබුණි.
B - ෆිර්අව්න්ගේ පාලනය පැවති ඊජිප්තුවේ රජවරු දේව පරම්පරාවෙන් පැමිණි බව විශ්වාස කළහ.
C - මෙලොව හා පරලොව ජයග්‍රහණය පිණිස මඟපෙන්වීම ඉස්ලාම් ශිෂ්ටාචාරයෙහි අන්තර්ගත ය.
D - රෝම ශිෂ්ටාචාරයේ අධ්‍යාපන ක්ෂේත්‍රයට දායකත්වය ඉටු කළ පුද්ගලයින් ලෙස සොක්‍රටීස්, ඇරිස්ටෝටල් හා ප්ලේටෝ සැලකේ.
E - සිල්වෙස්ටර් II වැනි පාප්තුමා ස්පාඤ්ඤයේ රැඳී සිට ඉස්ලාම් ශිෂ්ටාචාරය සම්බන්ධව අධ්‍යයනය කොට තම රටට ආපසු සම්ප්‍රාප්තවීමෙන් පසු ඒවා තම ජනයා අතරට ඉදිරිපත් කළ පසු ජනයා විසින් සතුටින් පිළිගත්හ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(1) C ය. (2) E ය. (3) B සහ D ය.
(4) A, B සහ E ය. (5) A, C සහ E ය.

**35.** පහත **X** තීරුවේ සඳහන් තොරතුරු සහ **Y** තීරුවේ සඳහන් තොරතුරු අතර සම්බන්ධතාවයක් ඇත. නමුත් ඒවා දැක්වෙන්නේ අනුපිළිවෙළින් නොවේ.

| X | Y |
|---|---|
| 1. තෆ්ලීල් අහ්කාම් | A - පැහැදිලි නීතිය |
| 2. ඉබාරතුන්නස් | B - පැහැදිලි නීතියෙන් ලබාගත් සැඟවුනු නීති |
| 3. සබබුන් නුසූල් | C - නීතිවලට අදාළ කරුණු පැහැදිලි කිරීම |
| 4. ඉෂාරතුන්නස් | D - අල්-කුර්ආන් වාක්‍ය පහළ කිරීමට තුඩුදුන් හේතු |
| 5. ඉක්තිලා උන්නස් | E - පැහැදිලි නීතිවලින් ලබා ගන්නා තීරණ |

X තීරුවේ සඳහන් තොරතුරුවලට අනුව Y තීරුවේ සඳහන් තොරතුරු පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි වරණය තෝරන්න.

(1) A B C D E (2) B C A E D (3) C A D B E
(4) C A D E B (5) D E C A B

**36.** පහත දැක්වෙන වචන සළකන්න.

A - රබ්බානියියත්
B - මුල්කියියත්
C - උමූමියියා
D - සුමුලියියා
E - අක්ලියියා
F - වාකි ඉයියා
G - හාකිමියියා

ඉහත වචන අතුරෙන් ඉස්ලාම් ෂරියා ලක්ෂණ දැක්වෙන වරණය තෝරන්න.

(1) A, B, D, E (2) A, C, D, F (3) A, C, F, G
(4) B, C, D, E (5) B, D, F, G

**37.** නබිතුමා මදිනාහි තම රාජ්‍ය ස්ථාපිත කළ පසු විවිධ කාලච්ඡේදවල විවිධ කණ්ඩායම් සමග ගිවිසුම් ඇති කර ගත්තේ ය. එයට හේතුව වන්නේ,

(1) සතුරන්ට ඇති බිය නිසා ය.
(2) යුධ උපක්‍රමයක් ලෙස පසුව ශක්තිමත් වී නැගී සිටීම සඳහා සටන් විරාමයකට යාම ය.
(3) සතුරන්ගේ එදිරිවාදිකම් වළක්වා තම කටයුත්ත වූ දෑවා කටයුතු ඉදිරියට ගෙන යෑම ය.
(4) පොරොන්දු ඉටු කිරීම යන ගුණාංගය බලගන්වා ජනයා අතර බියෙන් තොර පරිසරයක් ඇති කිරීම ය.
(5) යුද්ධයේදී මිනිසුන්ගේ ජීවිත ජයග්‍රහණය කරනවාට වඩා ගිවිසුම් මගින් ජයග්‍රහණය කිරීමේ උත්සාහය ය.

**38.** තුර්කි ඉස්ලාමික කිලාෆතයෙහි බිඳවැටීමට හේතු වූ පුද්ගලයා වන්නේ,

(1) ෆ්‍රෙඩ්රික් රජු ය. (2) චාල්ස් රජු ය. (3) හුලාකු ඛාන් ය.
(4) මුස්තෆා කමාල් ය. (5) තුන්වන පිලිප් ය.

**39.** **කාලිත් බින් බකායා** නම් වූ ශිලා ලේඛනය ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයේ මුස්ලිම්වරු පදිංචි වී සිටි බවට මූලාශ්‍රය වන්නේ ද?

(1) වැලිගම (2) කොළඹ (3) බේරුවල (4) පුත්තලම (5) ත්‍රිකුණාමලය

**40.** පහත වගුවේ **X** තීරුවෙන් හදීස් ක්ෂේත්‍රයට සම්බන්ධ වූ ඉමාම්වරුන්ගේ නම් ද **Y** තීරුවෙන් ඔවුන් ජනයා අතර ප්‍රචලිතව සිටි අන්වර්ථ නාමයන් ද අනුපිළිවෙළින් තොරව දක්වා ඇත.

| X | Y |
|---|---|
| 1. මුහම්මදු ඉබ්නු ඉස්මයිල් | A - අන්නසායි |
| 2. මුස්ලිම් බින් හජ්ජාජ් | B - අබූදාවූද් |
| 3. සුලෛමාන් බින් අස්අස් | C - තිර්මිදි |
| 4. මුහම්මද් බින් ඊසා | D - මුස්ලිම් |
| 5. අබූ අබ්දුර් රහ්මාන් අහ්මද් බින් සුඅයිබ් | E - බුහාරි |

X තීරුවේ සඳහන් තොරතුරුවලට අනුව, Y තීරුවේ සඳහන් තොරතුරු අනුපිළිවෙළින් පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි වරණය තෝරන්න.

(1) A C D E B (2) A C B E D (3) A D E C B
(4) E B A C D (5) E D B C A

**41.** **මකාසිදුෂ් ෂරිආ** හි ප්‍රධාන පියවර තුන දැක්වෙන වරණය තෝරන්න.
(1) ඉබාදත්, ඉමාරත්, කිලාෆත් (2) ඉබාදත්, මුආමලාත්, ජිනායාත්
(3) ඉමාමත්, තකීයියත්, ඉස්මත් (4) තස්කියියත්, තරීක්කත්, සලාමත්
(5) ලරූරියියාත්, හාජියියාත්, තහ්සීනියියාත්

**42.** ඉස්ලාම් ව්‍යවහාරයේ **තජ්දීද්** යන පදයෙහි අර්ථය වන්නේ,
(1) නවීන චින්තනයන්ට අනුව ඉස්ලාමය හැඩගැස්වීම ය.
(2) සමාජයේ පැනනගින ගැටලුවලට ඉස්ලාමීය මගපෙන්වීම යටතේ විසඳුම් සෙවීමය.
(3) ඉස්ලාමයට එක්වී තිබෙන ඉස්ලාම් නොවූ කරුණු ඉවත් කොට ඉස්ලාම් එහි ආරම්භක තත්ත්වයට පත් කිරීම ය.
(4) ඉස්ලාම් ආගමික ඇදහීම්වල දී අලුත් අලුත් දේ එකතු කිරීම ය.
(5) නබි මුහම්මද් (සල්) තුමාගේ ආදර්ශයන් ජීවිතයට ආදේශ කර ගැනීම ය.

**43.** අල්-කුර්ආන්හි පළමු වාක්‍ය නබි තුමා වෙත පහළ වූ නිවැරදි අනුපිළිවෙළ කුමක්ද?
(1) ලව්හුල් මහ්ෆූල් ⟶ බෛතුල් ඉස්සා ⟶ ජිබ්රයිල් (අලෛ) ⟶ හිරා ගුහාව
(2) ලව්හුල් මහ්ෆූල් ⟶ බෛතුල් ඉස්සා ⟶ ජිබ්රයිල් (අලෛ) ⟶ සව්ර් ගුහාව
(3) බෛතුල් ඉස්සා ⟶ ලව්හුල් මහ්ෆූල් ⟶ ජිබ්රයිල් (අලෛ) ⟶ හිරා ගුහාව
(4) බෛතුල් ඉස්සා ⟶ ලව්හුල් මහ්ෆූල් ⟶ ජිබ්රයිල් (අලෛ) ⟶ සව්ර් ගුහාව
(5) ජිබ්රයිල් (අලෛ) ⟶ බෛතුල් ඉස්සා ⟶ ලව්හුල් මහ්ෆූල් ⟶ සව්ර් ගුහාව

**44.** "සිකුරාදා දිනවල ජුම්මා කාලය තුළ වෙළෙඳාම් නොකළ යුතු ය" යන නීතියෙහි **මකාසිදුෂ් ෂරිආ** ලෙස සලකනු ලබන්නේ කුමක් ද?
(1) සිකුරාදා දිනයන්හි වෙළෙඳාම් කිරීම නොකළ යුතු බව ය.
(2) ජුම්මා කාලය තුළ වෙළඳාමෙන් ඉවත්ව වෙනත් වේලාවන්හි කැපවීමෙන් වෙළෙඳ කටයුතුවල යෙදිය යුතු බව ය.
(3) ආගමික යාච්ඤාවන්ට බාධා වන පරිදි වෙළෙඳාම හෝ වෙනත් කිසිදු දෙයක් කිරීම යෝග්‍ය නොවන බව ය.
(4) ජුම්මා වන්දනාවට අනිවාර්යයෙන් සහභාගිවන අතර ජුම්මා අවසන් වූ පසු ඉක්මනින් ගොස් වෙළෙඳාම් කළ යුතු බව ය.
(5) ජුම්ආහි කැමැත්ත ඇති අය එයට සහභාගි විය හැකි බවත් අනෙක් අය තමාගේ කැමැත්ත පරිදි වෙළෙඳාම් සිදු කොට තව්බා සිදු කළ හැකි බවත් ය.

**45.** **ඉජ්මා උස් සරීහ්** පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ඉජ්මා උස්සරීහ් සහ ඉජ්මාඋ අක්සරියියා යන්න සමාන අර්ථයයන්ගෙන් යුක්ත ය.
(2) ඉජ්මා උස්සරීහ් යනු ඉජ්මා උස්සුකූතිවලට ප්‍රතිවිරුද්ධ දෙයකි.
(3) ඉජ්මා උස්සරීහ් ඇති වීමට නිශ්චිත කාලයක් තුළ ජීවත් වන මුජ්තහිද්වරු සියලු දෙනා අදහස් හුවමාරු කරගත යුතු ය.
(4) ඉජ්මා උස්සරීහ් ඇති වීමට ආහාද් වූ හදීස්වලට වඩා මුතවාතිර් වූ හදීස් මූලාශ්‍ර ලෙස තිබිය යුතු වේ.
(5) ඉජ්මා උස්සරීහ් , මුතවාතිර් මට්ටමේ හදීස්වලට සමාන වේ.

[අටවැනි පිටුව බලන්න.

● අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | නිවැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැනි ප්‍රකාශය** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **46.** | සමාජයක බහුතරයක් තම ජීවිතයේ වචන හා ක්‍රියාවලින් අනුගමනය කරන සම්ප්‍රදායන් 'උර්ෆු' ලෙස ගැනේ. | දෑවා කටයුතු සරල කරන අතර මනස ශක්තිමත්ව තබා ගැනීම, අල්-කුර්ආනය එක් වරක දී සම්පූර්ණයෙන්ම පහළ නොවීමට හේතුවක් ලෙස සැලකේ. |
| **47.** | "තජ්ලා ගංගා ඉවුරේ එළු පැටියෙක් ලිස්සා වැටුණත්, එයට පිළිතුරු සැපයීමක් මාගේ වගකීමකි." යනුවෙන් පාලකයාගේ වගකීම උමර් (රළි) තුමා පෙන්වා දුන්නේ ය. | හිජ්රි 9 වන වසරේ හජ් නියම කරන ලද විට හාජිවරු කණ්ඩායම නබිතුමාගේ නායකත්වයෙන් මක්කාව බලා ගමන ආරම්භ කළේ ය. |
| **48.** | මුස්ලිම් නක්ෂත්‍රයින් විසින් සමහර තාරකා සඳහා අක්රබ්, අත්තයිර්, නාදිර් වැනි නම් තබන ලදී. | ෂීආවරුන් අතර වඩාත් අධික සංඛ්‍යාවක් සහ බලයක් තිබූ අය ඉස්මාඊලියියා පාර්ශ්වය වේ. |
| **49.** | උමයියා සමයේ අරාබි අක්ෂර විද්‍යාවේ වර්ධනයට ඉස්හාක් සහ වහ්හාබ් යන සහෝදරුවරු මහඟු දායකත්වයක් ඉටු කර ඇත. | මුස්ලිම්වරුන් සහ යුදෙව්වන් හට තම තමන්ගේ ආගම සම්පූර්ණයෙන්ම පිළිපැදිය හැකි ය යන රීතිය මදීනා ශාසනයේ දැක ගත හැකි ය. |
| **50.** | සහාබිවරුන්ගේ සමයේ අල්-කුර්ආන්වලින් පමණක් ඉජ්තිහාද් සිදු කරන ලද බව කීම අසත්‍යයකි. | නබිවරුන් හා රසුල්වරුන්ගේ පැමිණීම අවසන් වූ ලෙසම මුජ්තහිද්වරුන්ගේ පැමිණීම ද අවසන් වී ඇත. |

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) නබිතුමාට අල්-කුර්ආන් කොටස් වශයෙන් පහළ වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

(ii) අල්-කුර්ආන් සංග්‍රහය පිළිබඳ සඳහන් කොට, උස්මාන් (රළි) තුමාගේ සමයේ සිදු කළ කුර්ආන් සංග්‍රහවල වාසි **දෙකක්** පැහැදිලි කරන්න.

(iii) ව්‍යාජ හදීස් බිහිවීමට හේතු වූ කරුණු **හතරක්** සඳහන් කර, ඒවායින් **දෙකක්** ගැන කෙටියෙන් විස්තර කරන්න.

(iv) ආගමික, සමාජ සංහිඳියාව සම්බන්ධව නබිතුමාගේ මඟපෙන්වීම් **හතරක්** නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

(v) ඔබ ජීවත්වන පරිසරයේ ආගමික සංහිඳියාව ස්ථාපිත කිරීමට ගත යුතු ක්‍රියා මාර්ග **හතරක්** පැහැදිලිව විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20)

**2.** (i) තනි පුද්ගලයෙක්, තමා සහ තම මැවුම්කරුවාණන් අතර සබඳතාවය ශක්තිමත් කර ගැනීමෙන් ලැබෙන වාසි **හතරක්** සඳහන් කරන්න.

(ii) මිනිස් නීතිය හා දේව නීතිය අතර වෙනස්කම් **හතරක්** සඳහන් කොට, ඒවායින් **දෙකක්** විස්තර කරන්න.

(iii) මකාසිදුෂ් ෂරිආහි ළරුරියියාත් කොටසේ අඩංගුවන අංග **හයක්** සඳහන් කොට, ඒවායින් **දෙකක්** විස්තර කරන්න.

(iv) කියාස් නීති මූලාශ්‍රවල මූලධර්ම **හතර** සඳහන් කොට, ඒවායින් **දෙකක්** ගැන නිදසුන් සහිතව විස්තර කරන්න.

(v) තබඋත් තාබිඊන්වරුගේ සමයේ තෆ්සීර් ක්ෂේත්‍රයට කළ දායකත්වය ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 04 × 5 = 20)

**3.** (i) මුස්ලිම්වරු තාරකාවිද්‍යා ක්ෂේත්‍රයේ යෙදීමට හේතු වූ සාධක **හතරක්** සඳහන් කරන්න.

(ii) වෛද්‍ය ක්ෂේත්‍රය තුළ මුස්ලිම්වරුන්ගේ සොයා ගැනීම් **හතරක්** සඳහන් කොට, ඒවායින් **දෙකක්** ගැන කෙටියෙන් විස්තර කරන්න.

(iii) මුඃතසිලාවරුන්ගේ ප්‍රධාන සිද්ධාන්ත **හතරක්** සඳහන් කොට, ඒවායින් **දෙකක්** ගැන විස්තර කරන්න.

(iv) බෛතුල් හික්මා, විද්‍යා ක්ෂේත්‍රයට සිදු කළ දායකත්වය සඳහන් කොට, ඒවායින් **එකක්** ඇගයීමට ලක් කරන්න.

(v) ෂියාවරුන්ගේ උප කොටස් **හතරක්** සඳහන් කොට, ඔවුන්ගෙන් **ඉස්නා අෂරියියාවරු** ගැන කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20)

## II කොටස

**4.** (i) 'නීති ව්‍යුත්පන්න වීම සඳහා ඉජ්තිහාද් මාර්ගයක් වේ' යන්න අල්-කුර්ආන් සහ අල් හදීස්හි සාක්ෂි සහිතව විමසන්න.

(ii) ඉස්ලාම් ශිෂ්ටාචාරයන් අකර්මන්‍යවීමට හේතු වූ කරුණු **පහක්** සඳහන් කොට ඒවා විස්තර කරන්න.

(ලකුණු $10 \times 2 = 20$)

**5.** (i) උමෙයියා කිලාෆතය ස්ථාවර කිරීමට කලීෆා මුආවියා (රලි) සහ කලීෆා අබ්දුල් මලික්ගේ ක්‍රියාවන් සංසන්දනය කරන්න.

(ii) උමෙයියාවරුන්ගේ සිට අබ්බාසිවරුන්ට පාලනය මාරුවීමෙන් පසු සිදුවූ වෙනස්කම් පරීක්ෂා කරන්න.

(ලකුණු $10 \times 2 = 20$)

**6.** (i) විවිධ මත පැන නැගීමට හේතුවන කරුණු කෙටියෙන් සඳහන් කොට, එම මත පැන නැගුණු අවස්ථාවල අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත පරීක්ෂා කරන්න.

(ii) කලීෆා උස්මාන් (රලි) කිලාෆතයට තෝරාපත් කළ ක්‍රමය සඳහන් කොට, ඔහුගේ සේවාව අගය කරන්න.

(ලකුණු $10 \times 2 = 20$)

**7.** (i) ශ්‍රී ලංකාවේ මුල් කාලයේ දී බිහිවූ මුස්ලිම් ජනාවාස, වෙරළබඩ ප්‍රදේශයේ ඇතිවීමට හේතු සඳහන් කොට ඒවායින් ජනාවාස **දෙකක්** ගැන සාක්ෂි සහිතව විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ ස්වෛරිභාවය සුරැකීමට මුස්ලිම්වරුන් ලබාදුන් දායකත්වය අගය කරන්න.

(ලකුණු $10 \times 2 = 20$)

**8.** (i) ස්ත්‍රීන්ට ඉස්ලාම් ලබා දී ඇති ගෞරවය සහ ආරක්ෂාව පිළිබඳව පැහැදිලි කරන්න.

(ii) ඉස්ලාමික මගපෙන්වීම අනුව මුස්ලිම්වරයකු අනෙක් ජීවීන් සම්බන්ධව අනුගමනය කළ යුතු පිළිවෙත විස්තර කරන්න.

(ලකුණු $10 \times 2 = 20$)

* * *